


## කරදිය ලෝලයාගේ තෙතබරිත හැන්දෑව

ජගත් රණතුංග

හමන දඟ සුළං නිරිතෙන්
සදන රළ රැලි ඈත දියඹෙන්
හමන උමතු රළ * රළ ලුහුබඳිමින්
දිවෙන රඟට නුඹ කඩොලෙකි සයිමන්

කරදියට පාව විත් නිල්වලා මිරිදියෙන
මුදුන් වන රළ සමග මුදුන් වන
කරට කරදිය පෙණ මුතු පළන්දන
නුඹෙ සැකිලි රුව අගෙයි මේ වෙරළ උදම් වන

හිරුගෙ මරණයෙ රන්කෙඳි වැටෙන
ළය මඩල රන්වන්ය රන්කෙසින්
දිය කෙළින ලෑලි පලසින් තරඟ රළ පිට නැගුණ
සමබරය නුඹ වෙරළ වෙත වේගයෙන් ඇදී එන

දකුණු දිග සැඳෑ කළුවර හැපෙන
රළ වළප මත පරෙවි දූපත හිඳින
නැවතුමට සිත නොදෙන දියකෙළිය සනාතන
නුඹ ගැන දුකෙනි නිකරුණේ ලවණෝහි දිරන...

අව්වැසි
සුළඟ හට
දෙපා නැති මුත්
නිතියෙන
ඇවිත් යයි
මහගෙදර මිදුලට ...

මිදුල වට
තුරු වැල් පෙළ
සලයි
පර මල්
පරඬැල් වුව
තනි නොතනියට
ඉඳ හිට ...

ගගන සරනා
විහඟුන්
විටෙක විත්
වී පැදුරට
ගෙන යාය
වී ඇටයක්
පුදා
උන් තුඩ
ගිතය .....

බෝ දනන්
යන එන
මහගෙදර ගෙමිදුල
එරබදු පලස අතුරන
දින ද
දරුමුණුබුරන්
පා ලකුණු
නො දකින ...

**එරාඩිනී හසිනි ලංකා**




## ඔබ සිටියානම් තවමත්

**වර්ණා රසිකා ගුණවර්ධන**

බොහෝ අය බොහෝ දේවල් කරන
මේ නිහඬ මොහොතෙහි
ඔබ සිටියානම් තවමත්
කාලය කෙලෙස ගෙවෙනු ඇතිද ?

"පුතා කතා කලාද?
එයාල සතුටින්ද?
ඔයා දැන් ලියන්නෙ නැද්ද?
ඉඳහිටවත් ලියන්න මට කියවන්න."

"දුව එනවලූද ?
වයිෆ් තවම තරහද?
ඔන්නොහෙ යාලූවෙන්න.
කී කාලයක් ඉඳීද දන්නවද?"

"මට ඕනිවෙලා තිබුණා දෙන්න
එක්කම
සමනළ සංධ්වනිය බලන්න
එයාට පංසලේ වැඩක්ලූ .
මං ඉතින් තනියම ගියා.
ජෝඩු ජෝඩු ඇවිත් හිටියේ
මට මහ මොකද්ද වගේ."

"ඔයාට තිබුනේ අද පංසල් යන්න
හෙට ෆිල්ම් එකට යන්න
වැඩ දෙකම කෙරෙනවා
දෙන්නම සතුටිනුත් ඉන්නවා"

"අලවන්න බැරි විදියට
ඉරිලා ගිහින් ජීවිතය
දන්නවද මං ඊයේ හවස
කවිපොත් සේරම ගිණි තිබ්බා
කටු අකුරු කොලත් එක්කම
එයා දැකලත් නොදැක්ක වගේ
හිටියා."

"ඔයාගේ අසනීප කොහොමද?
ඔහොම බීමනම් හොඳ නෑ
සිරෝසිස් කියන්නේ නරක ලෙඩක්
සනීප කරන්න ලේසි නෑ "

"දන්නවද කුරුල්ලෝ දෙන්නෙක්
අඹ ගහේ කූඩු හදනවා
නිතරම කිචි බිචිය කච බචය .
අසනීප ගැන කතා නොකර ඉමු
ඔන්න මම කතා නොකර හිටියොත්
සතියක් දෙකක් ,මාසයක් හමාරක්
මම ගියා කියල හිතාගන්න.
මං ගැන කවියක් ලියන්න."

බොහෝ අය බොහෝ දේවල් කරන
මේ නිහඬ මොහොතෙහි
ඔබ සිටියානම් තවමත්
කොතරම් දේවල් කියනු ඇතිද ?

## අවසන.......

මහදුරු තුමනි දෙමළ
අවසන් ගමන් ගිය ...... මහාලිංගම්
මුහුණු පොත තුල දිස්විය
ගිය අයුරු ගමන
කොතරම් අපූරුද "නුඹ"
මේ කවිය නොවුනද කවියක්
සිංහළ යයි උප්පැන්නය නිසා
මම......

නුඹ වන් මිනිසෙකුට
පිදිය යුතු උපහාර පුදන්නට
අමතක නොකළ බව ලියා
තැබූ බව....... අනාගත පරපුරට
ඉව දැනෙන්නට

**ගාමිණී දසනායක**



## සෙනෙහසත් ලඟ නැවතුමයි

**නාලනී ද සිල්වා**

ඉපදුන දා ඉඳලා ආදරය කලත් සෙවු ආදරය
නොලැබුන කෙනෙක් හිතෙන් තවමත් දුක්වෙන හැටියක්

එදා බොරු කියු හදවතින්
නුඹ සැඟවුනත් නැටුමට බයෙන්
කෙසඟ නුඹවත් නොදුටු හදවත
වැලපුනා නාලය සිරවෙමින්

තුරුණු විය ලඟ දඩුවමින්
ආදරේ මුදු අනුහසින්
නාල එක එක සිරවෙලා හද
රිදුම් දුන්නද කඳුලකින්

වෙනස් වෙන අවුසද මගින්
තුරල් වෙන රිදුමට ලඟින්
පැලැස්තර දැමු දෑත් එක එක
ගනන් කරමුද ආදරෙන්
සුසුම් රැල්ලෙන් දවාලනු මැන
පහන් දැල්ලත් ෂණඳුරෙන්

සෙනෙහසත් ලඟ නැවතුමයි
වියෝගය අත වන වන දුවයි
ලඟාවෙන සුසුමක් අරන් එන
ජිවිතේ උනුහුම් පැන් බිඳයි
ආදරේ තවමත් අසරණයි
හදට ඉබිගමනින් සැපත්වෙන
රුධිර නාලය සෙනෙහසයි